සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

**1. ශ්‍රේණිය** :- 11 ශ්‍රේණිය **විෂය** :- සංගීතය **අදාළ සතිය** :- සැප්තැම්බර් 5 වන සතිය

**2.පාඩම/ ඒකකය**:- 7.1 Minor chords ගොඩනැගීම

**3. ශිෂ්‍යා කළ යුතු කාර්යයන් :-**

- සම්පූර්ණ ස්වර සප්තකයට අදාල ස්වර 12 ලියන්න.
- chords සංකල්පය අනුව Minor chords සෑදීම සඳහා යොදා ඇති සිද්ධාන්තය නිරීක්ෂණය කරන්න.
- ඒ අනුව සම්පූර්ණ ස්වර සප්තකයේ ස්වර 12 යොදා ගනිමින් Minor chords සාදා ගැනීමේ සිද්ධාන්තයට අනුව ස්වර වෙන් කර ගන්න.
- මේ සඳහා කියවීමේ පත්‍රිකාව අධ්‍යයනය කර Minor chords සඳහා ගන්නා ස්වර වල අංක පිරික්සන්න.
- උදාහරණ ලෙස දී ඇති C Minor chord එකට අදාල ස්වර ලබා ගන්නා ආකාරය කියවීම් පත්‍රිකාව තුලින් පැහැදිළි කර ගන්න.
- ඉන් පසු ස්වර සප්තකයේ ශුද්ධ ස්වර 7 සප්තක ලෙස ගෙන ඒවාට අදාල Minor chords ලියන්න.
- Minor chords සෑදීම සඳහා ගන්නා ස්වර වල අංක මොනවාද?( සම්පූර්ණ ස්වර සප්තකය අනුව)
- ස රි ග ම ප ධ නි යන ශුද්ධ ස්වර අනුව සාදා ගත් Minor chords බටහිර සංගීත අක්ෂර මගින් දක්වන්න.උදා - C Minor chord - C $E^b$ G
- $E^b$ හා $B^b$ Scale වල අදාල (සප්තක) Minor chords ලියන්න.

**4.ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කරගත හැකි ඉගෙනුම් ආධාරක :-**

- E - තක්සලාව - www.e –thaksalawa.moe.gov.lk
- e - නැණ පියස:- 11 ශ්‍රේණිය සංගීතය https:// www.enenapiyasa.lk/lms/
- 11 ශ්‍රේණිය සංගීතය අතිරේක කියවීම් පොත(සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව)
- බටහිර සංගීතය සිංහලෙන් - ප්‍රේමලාල් දාස්වත්ත මයා

**කියවීමේ පත්‍රිකාව**

බටහිර සංගීත සංකල්පයක් වන chords යනු ස්වර 3ක් හෝ ඊට වැඩි ගණනක් එකවර වාදනය කිරීමයි.

- **Minor scale** වල chords යෙදෙන ආකාරය පහත පරිදි වේ.

සම්පූර්ණ ස්වර සප්තකයේ ස්වර 12 පිලිවෙලින් ලියූ විට

1 2 3 4 5 6 7 8 9 10 11 12 13

ස රි රි ගු ග ම ම́ ප ධ ධ නි නි ස̇ මේ ආකාරය වේ.(මෙහිදී සම්පූර්ණ ස්වර සප්තකයේ ස්වර පිහිටීම පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා ගන්න.

**Minor scale** වල Minor chords සඳහා ගනු ලබන්නේ ඉහත ස්වර පිළිවෙල අනුව 1 4 8 යන අංක වලට හිමි ස්වර වේ. ඒ අනුව

ස ස්වරයෙන් පටන් ගන්නා සප්තකයට අදාල Minor chord හකෙහි ස්වර වන්නේ

ස - ස ගු ප

බටහිර සංගීතයට අනුව

C Minor ch - C $E^b$ G

මෙසේ ඕනෑම ස්වරයක් ආරම්භයට ගෙන chords ගොඩනගා ගත හැකිය.

**5. ඉගෙනුම් එල :-**

- Minor chord සෑදීමේ ක්‍රියාකාරකමෙහි නිරත වෙයි..
- Minor chords ගොඩ නගන ආකාරය අවබෝධ කර ගනියි.
- Minor chord එක සඳහා සම්පූර්ණ ස්වර සප්තකයේ 1 4 8 ස්වර එකට ගන්නා බව ලියයි.
- Minor scale වලට අදාලව Minor chords ලියා දක්වයි.

**සැකසුම** :- කෑගල්ල අධ්‍යාපන කලාපය